# ඇලහැර ප්‍රාදේශීය සභාව
# පොළොන්නරුව දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන.

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 අප්‍රේල් 08 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

### 1.2 මතය.

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඇලහැර ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | ගිණුම්කරණ අඩුපාඩුව | විෂයයන් ගණන | වටිනාකම |
|---|---|---|---|
| | | | රු. |
| (i) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 07 | 524,068 |
| (ii) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 01 | 110,368 |
| (iii) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 02 | 22,072,151 |
| (iv) | අනුචිත හෙළිදරව් කිරීම් | 05 | 636,747 |

#### 1.3.2 නොසැසඳුනු ගිණුම්

ගිණුම් විෂයයන් 04 කට අදාලව උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන්ගේ එකතුව රු. 5,914,375 ක් වූ අතර, විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂයන්ගේ එකතුව රු. 6,082,295 ක් වීමෙන් රු. 162,920 ක නොසැසඳීමක් විය.

1.3.3 අවිනිශ්චිත ගිණුම්

මුල්‍ය ප්‍රකාශන අනුව 2008 දෙසැම්බර් 31 දිනට රු. 28,233 ක්වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වනවිට රු. 276,543 දක්වා වර්ධනය වී තිබුණු නමුත්, එය හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 36,053,242 ක් වූ ගිණුම් විෂයයන් 07 ක් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති,රීති හා රෙගුලාසි විධි විධානවලට අනුකූල නොවීම් විගණනයේදී නිරීක්ෂණය විය.

| නීති, රීති හා රෙගුලාසි විධිවිධාන වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති | |
| රීති 59 | සෑම වර්ෂයකම මාර්තු 31 දිනට පෙර සභා බල ප්‍රදේශය තුළ සමීක්ෂණයක් සිදුකර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව පිළියෙල කළයුතු කර්මාන්ත පිළිබඳ ලැයිස්තුව, සමාලෝචිත වර්ෂයේදීද පිළියෙල කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 156(1) | සේවා නියුක්ති භාර අරමුදලට මුදල් යැවීම ප්‍රමාද කිරීම හේතු කොට ගෙන අධිභාර වශයෙන් ගෙවා තිබූ රු. 1,412 ක් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර නොතිබුණි. |
| (ii) මු.රෙ. 396 | ගිණුම් අංක 0005433459 දරන බැංකු ගිණුමට අදාල 2010 දෙසැම්බර් බැංකු සැසඳුම අනුව නිකුත් කළ නමුත් බැංකුවට ඉදිරිපත් නොකළ රු. 4,344 ක් වටිනා චෙක්පත් 03 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iii) මු.රෙ. 751 | (i) සමාලෝචිත වර්ෂයේදී සභාව විසින් මිලට ගෙන තිබුණු රු. 178,400 ක් වූ භාණ්ඩ ඉන්වෙන්ට්‍රි ලේඛනයට ඇතුළත් කර නොතිබුණි. |

(ii) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වු ආදායම රු. 610,736 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවු පුනරාවර්තන වියදම රු. 10, 403,982 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය.

### 2.2.1 ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්.

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|---|
| | ආදායම් විෂය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිගය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිගය |
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (i) | වරිපනම් හා බදු | 602 | 576 | 688 | 678 | 336 | 603 |
| (ii) | බදු කුලී | 1,336 | 1,257 | 274 | 1,331 | 1,710 | 272 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 115 | 82 | - | 190 | 71 | - |
| (iv) | වෙනත් ආදායම් | 18,460 | 12,637 | 4,492 | 13,435 | 1,228 | 350 |

### 2.2.2 උසාවි දඩ

විවිධ ආඥා පනත් යටතේ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර 31 දින දක්වා අය කර තිබුණු, සභාව වෙත ලැබිය යුතු, උසාවි දඩ මුදල රු. 4,107,568 ක් විය.

### 2.2.3 මුද්දර ගාස්තු

2006 සිට 2008 දෙසැම්බර් දක්වා සභාවට අයවිය යුතු මුද්දර ගාස්තුව රු .156,700 ක් වු අතර 2009, 2010 වර්ෂයන් සඳහා අයවිය යුතු මුද්දර ගාස්තුව ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි.

### 2.2.4 හිඟ වරිපනම් බදු

(i) 2010 දෙසැම්බර් 31 දිනට සභාවේ හිඟ වරිපනම් බදු රු. 687,700 ක් වු අතර, සමාලෝචිත වර්ෂයේ එකතු කළ වරිපනම් බදු ආදායම රු. 252,989 ක් විය. ඒ අනුව වරිපනම් බදු ආදායම් එකතු කිරීමේ ප්‍රගතිය 27% ක අගයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ii) වරිපනම් බදුකරුවන් 339 දෙනෙකුගෙන් වර්ෂ 3 සිට වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ අය නොවී පවතින රු. 554,406 ක හිඟ වරිපනම් බදු මුදල් අයකර ගැනීමට සභාව ප්‍රමාණවත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(iii) රාජ්‍ය ආයතන 05 කින් අයවිය යුතු රු.323,111 ක් වු හිඟ වරිපනම් බදු මුදල් දීර්ඝ කාලයක් තිස්සේ අයනොවී පවතින බව නිරීක්ෂණය විය.

### 2.2.5 හිඟ කඩ කුලී

බකමූණ සතිපොළ ඉදිරිපිට අංක 01 දරන කඩ කාමරයෙන් වර්ෂ 04 කට අධික කාලයක් තිස්සේ අයනොවී පවතින හිඟ කඩ කුලී ආදායම වු රු. 58,742 ක මුදල, 2010 මාර්තු 31 දින වන විටත් අයකර ගැනීමට නොහැකි වී තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු නීතිමය ක්‍රියාමාර්ගයක් ගැනීමටද කටයුතු කර නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය.

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමග පහත දැක්වේ.

| | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| වියදම් විෂය | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.'000. | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 8,776 | 9,098 | (322) | 9,295 | 8,522 | 773 |
| අනෙකුත් | 5,162 | 4,844 | 318 | 6,311 | 5,227 | 1,084 |
| උප එකතුව | 13,938 | 13,942 | (4) | 15,606 | 13,749 | 1,857 |
| ප්‍රාග්ධන වියදම | 6,570 | 6,802 | (232) | 10,237 | 10,042 | 195 |

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| මුළු එකතුව | 20,508 | 20,744 | (236) | 25,843 | 23,791 | 2,052 |

## 2.4 මානව සම්පත් කළමනාකරණය.

(අ) අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2010 දසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික ශ්‍රේණිය | 01 | - |
| (ii) | ද්විතියික ශ්‍රේණිය | 05 | 04 |
| (iii) | ප්‍රාථමික ශ්‍රේණිය | 12 | 13 |
| (iv) | වෙනත් (අනියම්, ආදේශක තාවකාලික) | - | 17 |
| | | 18 | 34 |

(ආ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 19(1) වගන්තියේ විධි විධාන අනුව පළාත් පාලන කොමසාරිස්ගේ අනුමැතිය ලබා නොගෙන සභාවේ අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා අනියම්, ආදේශක තනතුරු සඳහා සේවකයින් 17 ක් බඳවාගෙන වැටුප් හා දීමනා සඳහා සමාලෝචිත වර්ෂය තුළ රු. 2,494,950 ක මුදලක් සභා අරමුදලින් වියදම් දරා තිබුණි.

(ඇ) ඉහත අතිරික්ත සේවක සංඛ්‍යාවට අමතරව, සභාව විසින් පවත්වාගෙන යන මඩුදමන පානීය ජල ව්‍යාපෘතියට හා නැණසල ව්‍යාපෘතියට, ආදේශකයින් 06 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඔවුන් බඳවාගැනීම සම්බන්ධයෙන්ද, නිසි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 2.5 වත්කම් කළමනාකරණය.

### නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සභා අරමුදලින් හා පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන මත රු. 1,114,240 ක් වැයකර ස්ථාපිත කර ඇති සහල් පිටි ආශ්‍රිත ආහාර නිෂ්පාදන ව්‍යාපෘතිය, 2008 දෙසැම්බර් 28 දින විවෘත කර තිබුණු නමුත්, එදින සිට වර්ෂ 2 කට අධික කාලයක් ක්‍රියාකාරිත්වයෙන් තොරව නිෂ්ක්‍රීයව

පැවතුණි.

(ii) සහල් පිටි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය අක්‍රීය තත්වයේ පැවතියත්, 2010 වර්ෂයේ විදුලි හා ජල ගාස්තු සඳහා රු. 9,236 කට අධික මුදලක්ද, මුරකරුවෙකු සඳහා මාසික වැටුපක්ද ගෙවමින් එය නඩත්තු කරන ව්‍යාපෘතියකට පමණක් සීමාවී ඇති බව නිරීක්ෂණය විය.

(iii) 2007 පෙබරවාරි 12 දින ආපදා කළමනාකරණ සහන සේවා අමාත්‍යාංශය මගින් බෙදාදී තිබුණු රු .360,000 ක් වටිනා මෝටර බෝට්ටුව හා අගුල වර්ෂ 03 කට අධික කාලයක සිට කිසිදු ප්‍රයෝජනයකට නොගෙන නිශ්ක්‍රීයව තිබීම නිසා එම යන්ත්‍ර සූත්‍ර දිරාපත්වීමේ අවදානමකට ලක්විය හැකි බව නිරීක්ෂණය වු අතර, මෙවැනි සම්පත් ප්‍රයෝජනයක් ලබා ගත හැකි ආයතනයක් වෙත යොමු කිරීමෙන් රජයේ සම්පත් වඩා ඵලදායී කාර්යයක යෙදවිය හැකි බව නිරීක්ෂණය කෙරේණි.

2.6 කාර්ය සාධනය

-----------------

සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාර් සැලැස්මක් නොවීම

-----------------------------------------------------------

(අ) මහාභාණ්ඩාගාරයේ අංක පීඑෆ්/ආර්/2/2/2/3/5/(4) සහ 2010 මාර්තු 10 දින දරන චක්‍රලේඛයේ 05.1 ජේදය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවට පැවරී ඇති කාර්යයන් ඉදිරි වර්ෂවලදී ඉටුකිරීමට සැලසුම් කර ඇති ආකාරය දැක්වෙන සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ආ) සභාවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා මුල්‍ය, මානව හා භෞතික සම්පත් නිසි කළමනාකරණ ප්‍රවේශයකට යොමුකර පවත්වා ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාර් සැලැස්මක් (මුල්‍ය හා භෞතික) පිළියෙල කර නොතිබුණි.

3 පද්ධති හා පාලන

------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය
(ඈ) කොන්ත්‍රාත් පරිපාලනය
(ඉ) ණයගැති හා ණයහිමි පාලනය